# මනස හා ද්‍රව්‍යය

ප්‍රත්‍යක්ෂ ඇතිවන්නේ මිනිසා ඇතුළු ප්‍රාණීන්ට ය. එසේත් නැතහොත් ප්‍රත්‍යක්ෂ ලබාගන්නේ මිනිසුන් ඇතුළු ප්‍රාණීන් විසින් යැයි කිව හැකි ය. ප්‍රත්‍යක්ෂයෙහි දී වැදගත් වනුයේ මනස ය. මනස , විඥානය ආදිය ගැන ලෝකයෙහි විවිධ මතිමතාන්තර ඇත. සිංහල බෞද්ධ චින්තනය තුළ අප විසින් මනස පිළිබඳ නිර්මාණය කරන ලද ප්‍රවාදයක් ද වෙයි. ඇතැම් විට ලෝකයේ ඇති අමාරුම ප්‍රශ්නය ද මනස යනු කුමක් ද යන්න විය හැකි ය. ඒ ප්‍රශ්නයට පිළිතුරු දිය හැක්කේ ද මනස ඇසුරෙන්ම ය. වෙනත් බොහෝ ප්‍රශ්නවල දී මනසක් තිබේය යන්න අපි උපකල්පනය කරමු. පොල් ගෙඩි පොළොවට වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට ගුරුත්වාකර්ෂණය හෝ අවකාශ කාල වක්‍රතාවය හෝ පිළිතුර ලෙස ඉදිරිපත් කරන්නේ ද මනස ය. එහෙත් එහි දී මනසේ ක්‍රියාකාරීත්වය බටහිර විද්‍යාඥයන් විසින් සලකනු නොලැබෙයි. මනස විසින් ඒ පිළිතුරු නිර්මාණය කෙරී ඇත යන්න ගැන සලකාබැලීමටවත් බටහිර විද්‍යාඥයෝ උනන්දු නොවෙති. ඔවුන්ට ඒ පිළිතුරු මනසෙන් ස්වායත්ත වෙයි. මනස තිබුණ ද නොතිබුණ ද පොල් ගෙඩි වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය හෝ අවකාශ කාල වක්‍රතාවය හෝ නිසා යැයි ඔවුහු උපකල්පනය කරති. අප එයට උපකල්පනයක් යැයි කීව ද බටහිර විද්‍යාඥයෝ ඒ ගැන එසේ නොසිතති. ඔවුන්ට ඒ පිළිබඳ ඇත්තේ විශ්වාසයකි. මනස තිබුණ ද නොතිබුණ ද පොල් වටෙන බවත් එයට හේතුව ගුරුත්වාකර්ෂණය හෝ අවකාශ කාල වක්‍රතාවය හෝ වෙනත් කරුණක් නිසා හෝ බවත් ඔවුන්ගේ චින්තනයෙහි ම වෙයි.

බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි මනස ගැන ඇත්තේ ආකල්ප දෙකකි. එක් ආකල්පයකට අනුව දළ වශයෙන් ගත්කල මනස ප්‍රධාන වන අතර, ද්‍රව්‍යය යනු මනසේ නිර්මාණ වෙයි. සාමාන්‍යයෙන් මේ මතය විඥානවාදී (idealist) මතය ලෙස හැඳින්වෙයි. මෙය සිංහල බෞද්ධ මතය ද වේ යැයි නොසිතිය යුතු ය. බටහිරයන් මනස ප්‍රධාන ලෙස ගන්නේ මනො පුබ්බංගමා ධම්මා යන අර්ථයකින් නොවේ. බටහිරයන්ට අනුව එහි දී මනස මූල හේතුව වෙයි. එ පමණක් නොවේ. ඔවුන්ට අනුව, එනම් බටහිර විඥානවාදීන්ට අනුව, පවතින්නේ මනස පමණ ය. ඒ දෙවියන් වහන්සේ ගේ මනස හෙවත් පරම මනස සමග බැඳී ඇත. මනස හැරෙන්නට අන් සියල්ල මනසෙහි නිර්මාණ යැයි ද ඒ නොපවතින්නේ යැයි ද බටහිර විඥානවාදීහු සාමාන්‍යයෙන් විශ්වාස කරති. මෙහි දී සාමාන්‍යයෙන් යැයි කියැවෙන්නේ ඒ මතයෙහි යම් යම් ප්‍රභේද ඇති බැවිනි.

බටහිර විඥානවාදීන්ට අනුව පුටුව යනුවෙන් යමක් නොපවතියි. ඔවුන් ගේ මතය දළ වශයෙන් මෙසේ ගොණුකර ගත හැකි ය. පුටුව යනු පුටුවේ තදබව, එහි පාට, එහි හැඩය ආදී වශයෙන් ඇති ගුණවල එකතුවකින් මනස විසින් නිර්මාණය කෙරෙන්නෙකි. මේ ගුණ සියල්ල පොදියක් ලෙස ගත්කල, ඒ ඇසුරෙන් මනස විසින් පුටුව නිර්මාණය කෙරෙයි. එහෙත් පුටුවක් යනුවෙන් දෙයක් නැත. පුටුවේ ගුණ යනු ඇති පුටුවක, පවතින පුටුවක ගුණ නොවේ. පුටුව යනු මනසට ගෝචර වන මේ ගුණ ආධාර කර ගනිමින් මනස විසින් නිර්මාණය කෙරෙන ඇත්තට ම නොපවතින දෙයකි.

සිංහල බෞද්ධ මතයට අනුව, මනස ද නොපවතියි. මනස ප්‍රධාන ධර්මය වන්නේ අන් සියළු ධර්ම මනස විසින් නිර්මාණය කෙරෙන බැවින් පමණක් නොවේ. ඒ එක් ධර්මයකටවත් ඒ ධර්මය විසින් ම ඒ නිර්මාණය කෙරීමට නොහැකි බැවින් ය. මනස හැරෙන්නට වෙනත් ඕනෑම ධර්මයක් නිර්මාණය කෙරෙන්නේ මනසේ ආධාරයෙනි. මනස නැතිව ඒ එකදු ධර්මයකටවත් සාපේක්ෂක පැවැත්මක් හෝ නැත. එහෙත් මනස එසේ නොවේ. මනස නිර්මාණය කෙරෙන්නේ වෙනත් ධර්මයක් ආධාර කරගනිමින් නොවේ. මනස ද නිරමාණයක් වෙයි. එහෙත් ඒ නිර්මාණය කෙරෙන්නේ ද මනස විසින් ම ය. මනස හා අනෙක් ධර්ම අතර ඇති ප්‍රධාන ම වෙනස එය වෙයි. මනස ද නිර්මාණයක් ලෙස ගැනෙන බැවින් සිංහල බෞද්ධයෝ බටහිර හෝ වෙනත් කිසිම අර්ථයකින් හෝ විඥානවාදීහු නොවෙති.

බටහිර චින්තනයට අනුව අනෙක් ආකල්පය විඥානවාදී ආකල්පයෙහි විරුද්ධය වෙයි. ඒ අනුව ද්‍රව්‍යය (matter) ප්‍රධාන වෙයි. මනසෙන් තොරව ද්‍රව්‍යය පවතියි. මනස තිබුණ ද නොතිබුන ද ද්‍රව්‍යය වෙයි. මිනිසා ජීවත් වුව ද නැත ද ලෝකය පවතියි යන්න මෙහි සාමාන්‍ය අර්ථය වෙයි. ගස් ගල් ඉර හඳ ආදිය මිනිසාගෙන් තොරව පවතියි. පුටුව

© Prof. Nalin De Silva

යන්න මිනිසාගේ නිර්මාණයක් වුව ද එය නිර්මාණයක් වන්නේ මිනිසා එය ලී ආදී වෙනත් ද්‍රව්‍ය ආධාර කරගෙන නිර්මාණය කරන බැවිනි. වෙනත් කිසිම ද්‍රව්‍යයක් ආධාර කර නොගෙන කිසිවකුටවත් පුටුවක් නිර්මාණය කරගත හැකි නොවේ. ද්‍රව්‍යය ප්‍රධාන වෙයි. ද්‍රව්‍යය ප්‍රධාන වන්නේ ඒ මනසින් තොරව පවතින්නේය යන අරුතින් පමණක් නොවේ. මනස ද නිර්මාණය වන්නේ ද්‍රව්‍යයෙනි. මේ මතය සාමාන්‍යයෙන් භෞතිකවාදී හෙවත් ද්‍රව්‍යවාදී (materialist) යනුවෙන් වර්ගීකරණය කෙරෙයි. විඥානවාදී මතය සම්බන්ධයෙන් මෙන් ම ද්‍රව්‍යවාදී මතයෙහි ද විවිධ ප්‍රභේද වෙයි.

බටහිර ද්‍රව්‍යවාදීන්ට අනුව මනස ද්‍රව්‍යයේ ම විකාශයෙන් ඇතිවන දෙයකි. ද්‍රව්‍යයෙන් නිර්මාණය වූ සත්ත්වයා විකාශය වී මිනිසා නිර්මාණය වීමෙන් පසුව මිනිසාට ලැබුණු මොළය ආශ්‍රය කරගනිමින් මනස ඇතිවිණිය යන්න සාමාන්‍යයෙන් බටහිර ජීව විද්‍යාඥයන්ගේ ද අන් අයගේ ද මතය වෙයි. අද බටහිර ජීව විද්‍යාවේ කෙරෙන අධ්‍යයන අතර මනස (විඥානය - ඉංගිරිසියෙන් consciousness යනුවෙන් කියැවෙන්නේ සිංහල බෞද්ධයන් විඥානය යැයි කියන්නට නොවේ. එහෙත් දැනට අපි වෙනත් වචනයක් නොමැතිකම නිසා consciousness යන්න සඳහා ද විඥානය යන වචනය යොදා ගනිමු.) මොළයේ ක්‍රියාකාරීත්වය නිසා ඇතිවන්නක් ය යන්න තහවුරු කිරීම සඳහා කෙරෙන පර්යේෂණ ද වෙයි. මොළයේ ඒ ඒ ප්‍රදේශවලට ඉලෙක්ට්‍රෝඩ සවිකර යම් යම් අයට විවිධ කරුණු පිළිබඳ විඥානයන් ඇති කර මොළයේ ඒ ඒ ප්‍රදේශ ඒ ඒ විඥාන සමග සම්බන්ධවන්නේ කෙසේ දැයි තේරුම් කර දීම මේ පර්යේෂණවල අරමුණ වෙයි.

එහෙත් සිංහල බෞද්ධ විද්‍යාඥයන් එවැනි මගක ගමන් කළයුතු නොවේ. සිංහල බෞද්ධයන්ට අනුව මනස තිබීමට නැතහොත් මනසේ ක්‍රියාකාරීත්වයට මොළය අනිවාර්යයෙන් ම තිබිය යුතු නොවේ. මනස පිළිබඳ ඉහත සඳහන් කෙරී ඇති (එය එහි විස්තර කෙරී නැත. කර ඇත්තේ හුදෙක් ඒ ගැන සටහනක් කිරීම පමණකි.) සිංහල බෞද්ධ ප්‍රවාදයට අමතර ව මනස ගැන තවත් කරුණු ඒ පිළිබඳව ගොඩනගන ප්‍රවාදවලට ඇතුළත් කරගත හැකි ය. මිනිසුන්ට පමණක් නොව අනෙක් කාමාවචර සතුන්ට ද දෙවියන්ට හා බ්‍රහ්මයන්ට ඇතුළු රූපාවචර සතුන්ට ද මනස් ඇති බව සිංහල බෞද්ධයන්ගේ පිළිගැනීම වෙයි. කාමාවචර සතුන්ට මෙන් නොව රූපාවචර සතුන්ට මොළය යන ඉන්ද්‍රිය නැත. එවිට සිංහල බෞද්ධ ප්‍රවාදයකට එවැනි රූපාවචර සතුන්ට ද මනස් ඇත්තේ කෙසේ ද යන්න පැහැදිළි කිරීමට සිදුවෙයි.

ඒ සම්බන්ධයෙන් මතු දවසක ගොඩනැගෙන සිංහල බෞද්ධ ප්‍රවාදය කුමක් වුව ද, අපට දැනට කිවහැකි කරුණක් වෙයි. මොළය යන ඉන්ද්‍රිය මිනිසුන් හා වෙනත් කාමාවචර සතුන් සඳහා මනස සම්බන්ධයෙන් යොදාගැනෙන්නේ ආධාරකයක් ලෙස පමණකි. මනසට යම් සිතුවිල්ලක් දැනෙන විට, නැතහොත් මනසෙහි යම් විඥානයක් ඇති වන විට, මොළයෙහි යම් කොටසක් වෙනත් කොටසකට වඩා ක්‍රියාකාරී වනු ඇත. ඉලෙක්ට්‍රෝඩ මගින් බටහිර විද්‍යාඥයන් නිරීක්ෂණය කරන්නේ මේ වෙනස ය. උදාහරණයක් ලෙස ගතහොත් සතුටක් ඇතිවන විට යමකුගේ මොළයේ විශේෂිත කොටසකට සවිකර ඇති ඉලෙක්ට්‍රෝඩය මගින් බටහිර විද්‍යාඥයන්ට යම් සංඥාවක් ලැබෙනවා විය හැකි ය. එහෙත් යමකුට සතුටක් ලැබෙන්නේ මොළයේ ඒ කොටස ඒ අවස්ථාවේ දී ක්‍රියාත්මක වන නිසා නොවේ. මොළයේ යම්කිසි කොටසක් ක්‍රියාත්මකවීම සමග සතුටක් ඇතිවන්නේ යැයි කීමට වඩා මනසේ සතුටක් ඇතිවීම සමග මොළයේ අදාළ කොටස ක්‍රියාත්මක වන්නේ ය යන්න උචිත බව මගේ අදහස වෙයි. මනසට මොළය ආධාරකයක් මිස මනස මොළය විසින් ඇති කෙරෙන්නක් නොවේ ය යන්න මෙහි හරය වෙයි.

සිංහල බෞද්ධයන්ට අනුව සත්ත්වයකු මිය ගිය පසු ද චිත්ත පහළවීම නතර නොවේ. එහි තේරුම නම් මිය යැමෙන් පසුව ද මනසක් ඇති බව ගැනීම ය. මනස දිගින් දිගට ම පැවතීම ආත්මය යැයි ගතයුතු නොවේ. මනස පිළිබඳ සිංහල බෞද්ධ ප්‍රවාදය විසින් මෙය විස්තර කෙරෙයි. එසේ මරණින් පසුව ද මනස ක්‍රියාකාරි වීම පිළිගැනීම හේතුවෙන් මොළය නොමැතිව ද මනස පවතින බව , නිවැරදිව කියන්නේ නම් මනසක් ඇතැයි ගන්නා බව, සිංහල බෞද්ධයන්ට පිළිගැනීමට සිදුවෙයි. එබැවින් මනස පිළිබඳ සිංහල බෞද්ධ ප්‍රවාදයක මොලයක් යන්න අනිවාර්ය අංගයක් නොවිය යුතු ය.

© Prof. Nalin De Silva

මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. ද්‍රව්‍යය යනුවෙන් බටහිර දාර්ශනිකයන් අදහස් කරන්නේ ඉන්ද්‍රිය ගෝචර ද්‍රව්‍යය පමණක් නොවේ. ඔවුන්ට අනුව විකිරණය (radiation) ද ද්‍රව්‍යය වෙයි. සාමාන්‍යයෙන් බටහිර භෞතික විද්‍යාවේ ද්‍රව්‍යය හා විකිරණය (matter and radiation) යනුවෙන් කියැවුණ ද ඒ දෙකක් ලෙස නොගත යුතු වෙයි. අයින්ස්ටයින් විද්වතා විකිරණය ද ශක්තියක් බවත් ද්‍රව්‍යයේ ශක්තිය විකිරණය බවට පත්කිරීමට හැකි බවත් එහි දී නිකුත් කෙරෙන ශක්තිය $E = mc^2$ මගින් දෙන බවත් ප්‍රකාශ කිරීමෙන් පසුව ඇතැම් බටහිර විඥානවාදීන් තර්ක කරන්නට පටන්ගත්තේ ද්‍රව්‍යවාදය ඒ සමග අවසන් වූ බව ය. එහෙත් එය වැරදි නිගමනයකි. සිංහල බෞද්ධයෝ බටහිර විඥානවාදීන් වැටුණු උගුලේ නොවැටෙති.

බටහිර ද්‍රව්‍යවාදීන්ගේ ද්‍රව්‍යය විකිරණය බවට පත්වීමෙන් විනාශ නොවේ. අනෙක් අතට ද්‍රව්‍යය විශ්වය පිළිබඳ මහා පිපිරුම ප්‍රවාදයෙන් කියැවෙන ආකාරයට විශ්වයේ ආරම්භයේ දී විකිරණය තිබී පසුව විශ්වයේ විකාශය තුළ ප්‍රෝටෝන ඇතුළු අනෙක් අංශු නිර්මාණය වීම හේතුවෙන් ද්‍රව්‍යයට ඇති මූලික හා ප්‍රධාන බව නැති වන්නේවත් නොවේ. ද්‍රව්‍යය යන වචනය ව්‍යවහාරය තුළ ඉන්ද්‍රිය ගෝචර දෑට පමණක් යොදා ගැණුන ද, ඒ වචනය විකිරණයට යොදා නොගැණුන ද, විකිරණය යනු ද්‍රව්‍යයේ ම විශේෂ අවස්ථාවක් පමණකි. විකිරණය ද ද්‍රව්‍යය ම වෙයි. ද්‍රව්‍යයේ චාලක ශක්තිය මෙන් ම විකිරණයේ ශක්තිය ද ශක්ති ප්‍රභේදයකි. බටහිර ද්‍රව්‍යවාදීන් ද්‍රව්‍යය යනුවෙන් සඳහන් කරන විට ඔවුන් අදහස් කරන්නේ ද්‍රව්‍යය පමණක් නොවේ. එයට විකිරණය ද අඩංගු වෙයි. ඔබුන් ඇත්තට ම කතාකරන්නේ ශක්තිය පිළිබඳ ව ය. එහෙත් මේ ශක්තිය ආත්ම ශක්තිය හෝ කර්ම ශක්තිය හෝ වැන්නක් නොව මිණිය හැකි ශක්තියකි. අයින්ස්ටයින් විද්වතාගේ ඉහත සඳහන් සූත්‍රයෙන් එක් අතෙකින් කියැවෙන්නේ විකිරණ ශක්තිය හා ද්‍රව්‍ය ශක්තිය එකිනෙකට තුල්‍ය බව ය. බටහිර විද්‍යාඥයෝ ශක්තියේ සංස්ථිතිය ගැන උනන්දුවක් දක්වති. සංස්ථිතිය යන සංකල්පය පිටුපස ඇත්තේ මිණිය හැකි ය යන අදහස ය. අයින්ස්ටයින් විද්වතා ද්‍රව්‍යවාදය අවසන් කළා නොවේ. ඔහු එයට කිහිප අරුතකින් ම තවත් මානයක් එකතු කෙළේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva